www.agaram.lk

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය- කොළඹ 07

## Grade 11–First TermTest – June – 2021
## පළමු වාර පරීක්ෂණ - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :One hour

## Cvics
## පුරවැසි අධ්‍යාපනය

| 62 | S | I |
|---|---|---|

Name :- .....................................................Grade : -................ Index number:-...................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරන්න.

Agaram.LK - Keep your dreams alive!

1. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ගැටලුවක් වන්නේ ,
   (1) පුරවැසියන් විවිධ ජීවන වෘත්තීන්හී නියැලීම
   (2) රාජ්‍යයේ ජනගහනය අධිකවීම
   (3) නියමිත කාලය තුළ මැතිවරණය පැවත්වීම
   (4) බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීම

2. නීතියේ ගුණාංගයක් නොවන්නේ,
   (1) යුක්ති සහගත බව හා සාධාරණ බව
   (2) නිරවුල් හා පැහැදිලි බව
   (3) අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පනවන්නක් වීම.
   (4) වෙනස්වන සමාජ අවශ්‍යතාව අනුව වෙනස් නොවීම

3. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ප්‍රධාන ඇමතිවරයා පත්කරනු ලබන්නේ,
   (1)නීතිපති තුමා විසිනි
   (2)ජනාධිපතිතුමා විසින්
   (3)ආණ්ඩුකාරවරයා විසින්
   (4)අග්‍රාමාත්‍යතුමා විසින්

4. ප්‍රාන්තයක් යනු
   (1)සන්ධීය රාජ්‍යයක ප්‍රාදේශීය ආණ්ඩුවයි
   (2)ඒකීය රාජ්‍යයේ පාර්ලිමේන්තුවයි
   (3)මධ්‍යම ආණ්ඩුවට බලය බෙදාහරින ආයතනයයි
   (4)මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය අණ්ඩුව මෙහෙයවන ආයතනයයි.

5. බහු සංස්කෘතික සමාජයක යහපාලනයක් ක්‍රියාත්මක විමේදී ආර්ථික වශයෙන් අනන්‍යතාවය ප්‍රකාශ වන පිළිතුර වනුයේ
   (P)යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
   (Q)දේශපාලන නායකත්වයට ගරු කිරීම
   (R)කැමති දේශපාලන මතයක් දැරීම
   (S) වෘත්තීය සමිති පිහිටුවා ගැනීම
   (1) Q හා R (2)R හා S (3)P හා S (4)P හා Q

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

6. ගැල්ටුන්ගේ ගැටුම් පිළිබඳ ආකල්ප යනුවෙන් හඳුන්වන්නේ ගැටුම නිර්මාණය වීමට බලපාන පාර්ශවකරුවන්ගේ
   (1) දේශපාලන සාධක වේ
   (2) සංස්කෘතික සාධක වේ
   (3) සමාජ විද්‍යාත්මක සාධක වේ
   (4) මනෝ විද්‍යාත්මක සාධක වේ

7. ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යයක් වන්නේ,
   (1) සියලු පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීම වැළැක්වීම
   (2) නීතිඥ වෘත්තිය හා සම්බන්ධ කටයුතු
   (3) ආණ්ඩුකාරවරයා පත් කිරීම
   (4) පාර්ලිමේන්තුවේ විමසන ප්‍රශ්න සඳහා පිළිතුරු දීම.

8. බ්‍රිතාන්‍ය පාලන සමයේ හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරින් ශ්‍රී ලාංකිකයන්ට වැඩි දේශපාලන ඉඩක් හිමිවූ ප්‍රතිසංස්කරණය වන්නේ,
   (1) ඩොනමෝර්
   (2) කෲව් මැකලම්
   (3) කෝල්බෲක්
   (4) මැනිං

9. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගතකරණය ඇරඹුණේ,
   (1) මහාපරාක්‍රමබාහු රාජ්‍ය සමයේ සිටයි
   (2) බටහිර ජාතීන් මෙරට ආක්‍රමණය කිරීමක් සමඟයි
   (3) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීමක් සමඟය
   (4) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිටයි

10. ස්විට්සර්ලන්තයේ ස්වාධීන රාජ්‍යයක් ලෙස ගොඩනගා ගැනීමට හේතු නොවූයේ
   (1) වාර්ගික භාෂා හා ආගමික විවිධත්වයට සාර්ථකව මුහුණදීම සඳහා
   (2) යටත්විජිත වශයෙන් පැවතීමනේ ලද අමිහිරි අත්දැකීම්
   (3) ප්‍රංශය, ඉතාලිය , ජර්මනිය ,ඔස්ට්‍රියාව යන රටවල් හතර මැදිව පිහිටීම නිසා ජාතික ආරක්ෂාවට තර්ජන එල්ලවීම
   (4) භූගෝලීය විෂමතා හේතුවෙන් ආර්ථික සංවර්ධනය ළඟා කරගැනීමට අපහසුවීම

11. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බහු සංස්කෘතික සමාජයක පැවැත්ම උදෙසා නිර්දේශ කළ අයිතිවාසිකමක් වන්නේ
   (1) කැමති ආගමක් ඇදහීම
   (2) එක් ජාතියකට වැඩි වරප්‍රසාද ලබා දීම
   (3) සුළු ජාතීන්ට රටේ වෙනම පළාත් වෙන් කර දීම
   (4) එක් ජාතියකට අයත් දේපළ තවත් ජාතියකට පැවරීම තහනම් කිරිම

12. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට අනුව සංවෘත ලැයිස්තුවට අයත් විෂය සඳහන් වරණය වන්නේ
   (1) ජාතික ආරක්ෂාව හා විදේශ කටයුතු
   (2) සමාජ සේවා හා පුනරුත්ථාපන කටයුතු
   (3) කෘෂිකාර්ම ගොවිජන සේවා
   (4) පළාත් පාලන හා නිවාස සංවර්ධන කටයුතු

13. රාජ්‍යක ප්‍රධාන අංගයක් නොවන්නේ
   (1) භාණ්ඩාගාරය
   (2) ස්වාධිපත්‍යය
   (3) ජනගහනය
   (4) භූමිය

14. කැන්ටන් සතු බලතලයක් නොවන්නේ
   (1) බෝවන රෝග වැළැක්වීම
   (2) බදු පැනවීම හා එක් රැස් කිරීම
   (3) බැංකු කටයුතු
   (4) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන

15. ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න
   A)අවසාන අභියාචනාධිකරණ බලය
   B)පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම
   C)විවාහ සම්බන්ධ නඩු
   D)ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය

   (1)A හා B (2)A හා D (3)AB හා D පමණි (4)ABCD සියල්ල

16. අන්තර් ජාතික නීතියට අයත් නොවන්නේ
   (1) තේසවලාමේ නීතිය
   (2) සාගර නීතිය
   (3) අයෝජන නීතිය
   (4) පරිසර නීතිය

17. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විධායකය වන්නේ
   (1) ජනාධිපතිවරයා ඇතුලු කැබිනට් මණ්ඩලයයි.
   (2) ජනාධිපතිවරයා ඇතුලු මන්ත්‍රී කණ්ඩායමයි.
   (3) ජනාධිපති , අගමැති හා මන්ත්‍රී කණ්ඩායමයි.
   (4) අගමැතිවරයා හා අමාත්‍ය මණ්ඩලයයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

18. රටක දේශපාලන පක්ෂයක නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ
    (1) පාලන බලය ලබාගැනීමේ අරමුණයි.
    (2) සංවිධානය වූ පුද්ගල කණ්ඩායමක්.
    (3) පාලනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාලාවක්.
    (4) සෙසු පක්ෂයන් තමා වෙත හරවා ගැනීමේ අධිකාරී බලය.

19. උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක නිවැරදිව දැක්වෙන පිළිතුර
    (1) මුලතිව් , යාපනය , මඩකළපුව
    (2) කිලිනොච්චිය, මඩකළපුව, මන්නාරම
    (3) වව්නියාව , යාපනය , මුලතිව්
    (4) අම්පාර , වව්නියාව, මුලතිව්

20. නිදහස් සාධාරණ මැතිවරණයක ලක්ෂණයකි
    (1) ජන්ද දායකයන්ට මැතිවරණ කාර්යයන්ට සම්බන්ධවීමට හැකියාවක් නැත
    (2) නියමිත කාලසීමාවකට අනුව මැතිවරණ පැවැතිවීම අත්‍යවශ්‍ය නොවේ.
    (3) ජන්ද අපේක්ෂකයන්ට මැතිවරණ කාර්යයන්ට නිදහසේ සම්බන්ධවීමට ඇති හැකියාව.
    (4) නියමිත සුදුසුකම් සපුරා තිබුනද ජන්ද අපේක්ෂත්වය ලැබීමේ අයිතියක් නැතිවීම.

21. යහපාලනයක් ඇති සමාජයක දැකගත හැකි ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න
    (1) අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු නොවේ.
    (2) විනිවිද භාවයක් ඇත.
    (3) අයිතිවාසිකම් තහවුරු නොවීම.
    (4) නීතියේ අධිපත්‍යයට ගරු නොකරයි.

22. සන්ධීය රටවල් පමණක් ඇයත් නිවැරදි රටවල් කාණ්ඩය තෝරන්න
    (1) කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය
    (2) ලංකාව , ස්විට්සර්ලන්තය, ඔස්ට්‍රේලියාව
    (3) ප්‍රංශය, බ්‍රිතාන්‍ය , ඇමරිකා එක්සත් ජනපදය
    (4) ප්‍රංශය , ඔස්ට්‍රේලියාව, ස්විට්සර්ලන්තය

23. නව ආර්ථික සංවර්ධනයක් සමඟ ශ්‍රීලංකාවට මුහුණපෑමට සිදුවන අවාසියක් වන්නේ
    (1) ස්වානියුක්තිය ඉහළ යාම
    (2) විදේශ විනිමය ඉහළ යාම
    (3) රැකියා වෙළෙඳපල පුළුල් වීම
    (4) මේ සියල්ලම වැරදිය

Agaram.LK - Keep your dreams alive!
agaram.lk

24. පහතින් දැක්වෙන්නේ ලෝකයේ ක්‍රියාත්මකවන විවිධ ආර්ථික ක්‍රම හා එහි ලක්ෂණ දැක්වෙන ප්‍රකාශයකි ?

A.ධනවාදී
- පොදු දේපළ අයිතිය
- ලාභ චේතනාව

B.සමාජවාදී
- පොදු දේපළ අයිතිය
- සුබ සාධන සංකල්ප

C.මිශ්‍ර
- පුද්ගලික ව්‍යවසාය
- සුබ සාධන සංකල්ප

ඉහත ප්‍රකාශන වලින් ආර්ථික ක්‍රම හා එහි ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුරු වන්නේ

(1)A හා B (2) B හා C (3)A පමණි (4)B පමණි

25. පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට යොමු කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යයන් ඉටු කිරීමට ඇත්තේ

(1) නිදහස් ජනමාධ්‍යයන්ට
(2) රාජ්‍ය සේවකයන්ට
(3) රාජ්‍ය නොවන සංවිධානවලටය
(4) ස්වේච්ඡා සංවිධානවලටය

26. බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික සම්මිශ්‍රණය සඳහා බලපාන ප්‍රබලම සාධකයක් වන්නේ
(1) එකම සමාජයක විවිධ ජන කොටස් ජීවත් වීමයි.
(2) ගෝලීයකරණය හා සන්නිවේදන දියුණුවයි
(3) කාලයත් සමඟ ජන සමාජවල ඇතිවන වෙනස් වීමයි.
(4) ලොකයේ බලවත් රටවල් කුඩා රටවල් ආක්‍රමණය කිරීමයි.

27. පහත සඳහාන් ලක්ෂණ අතුරින් 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අදාළ ලක්ෂණ ඇතුළත් නිවැරැදි පිළිතුර වන්නේ
(A) ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීම
(B) විධායක ජනාධිපති ධූරය ඇතිකිරීම
(C) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම
(D) අණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම

(1) A හා B (2)B හා C (3)C හා D (4)A හා C

28. රාජ්‍ය වල ප්‍රධාන ස්වරූප දෙක කුමක්ද?
(1)ජාතික හා ප්‍රදේශීය (2)ඒකීය හා සන්ධීය
(3)ඒකාධිපති හා ප්‍රජාතන්ත්‍රවාදී (4)ජනාධිපති හා පාර්ලිමේන්තු

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

29. ඒකීය අණ්ඩුවක දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ
    (1) ප්‍රාන්ත ආණ්ඩුවල බලය හිමිවීම
    (2) විධායකය මගින් ව්‍යවස්ථාදායකය තේරීම
    (3) උත්තරීතර මන්ත්‍රන සභාවක් තිබීම
    (4) ස්වාධිපති බලය මධ්‍යම ආණ්ඩුව සතුවීම.

30. පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තොරාපත් කර ගන්නේ
    (1)වසර 4ට වරකි    (2) වසර 6ට වරකි
    (3)වසර 5ට වරකි    (4) වසර 8ට වරකි

31. සෑම වසරකම මානව හිමිකම් දිනය වශයෙන් සමරනුයේ,
    (1) දෙසැම්බර් 10 වෙනිදායි
    (2) දෙසැම්බර් 01 වනදායි
    (3) පෙබරවාරි 10 වෙනිදායි
    (4) ඔක්තෝබර් 01 වෙනිදායි

32. පාසල් යන සිසුවෙකු ලෙස ඔබෙන් ඉටුවිය යුතු වැදගත්ම යුතුකම වන්නේ
    (1) ගුරුවරුන්ට කීකරුවීම
    (2) උදෑසන පාසලට පැමිණීම
    (3) අධ්‍යාපන කටයුතු ඉතාහොඳින් සිදුකිරීම.
    (4) පාසලේ විනය නීති ආරක්ෂා කිරීම.

agaram.lk

33. "නීතිය යනු රාජ්‍ය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පද්ධතියකි." මෙම නිර්වචනය ඉදිරිපත් කළේ
    (1) ජෝන්ඔස්ටින්
    (2) ඊ. බී. ටයිලර්
    (3) ටී.එච්. ග්‍රීන්
    (4) මයිකල් ඇල්බිය

34. නීතියේ ප්‍රධානම පරමාර්ථ ලෙස දැක්වෙනුයේ
    (1) සමාජයක වැරදි කරන පුද්ගලයන් නීතිය හමුවට පැමිණවීමයි.
    (2) ජනතාවගේ ආරක්ෂාව සඳහා පාලනය මහෙයවීම
    (3) නීතිය පිළිබඳව පුරවැසියන්ගේ අවබෝධය තහවුරු කිරීමයි.
    (4) පුද්ගලයන්ගේ ජීවිත, දේපළ හා අයිතිවාසිකම් රැකෙනාසේ මානව හැසිරීම් පාලනය කිරීමයි.

35. මිනීමැරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ඇති අධිකරණය වනුයේ

(1) දිසා අධිකරණය
(2) පළාත්බද අධිකරණය
(3) අභියාචනාධිකරණය
(4) මහාධිකරණය

36. අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි බරපතල වැරදි පමණක් සඳහන් පිළිතුර

(1) වාණිජ කටයුතු, දික්කසාද, මිනීමැරුම්
(2) ස්ත්‍රී දූෂණ , දික්කසාද , ළමාඅපචාර
(3) ඉඩම් ආරවුල්, මිනීමැරුම්, ලිංගිකඅපචාර
(4) මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර

37. බලය විමධ්‍යගත  කිරීමේ දී මතුවන ගැටලුවක් නොවන්නේ මින් කුමක් ද?

(1) මුදල් උපයා ගැනීමේ දුෂ්කරතා
(2) සම්පත් විෂමතාවයකින් තොරව බෙදීයෑම.
(3) ආයතන කිහිපයක් එම කාර්යයේ යෙදීම නිසා ඒ ඒආයතනවල වගකීම සම්බන්ධ ගැටලු ඇතිවීම.
(4) මින් එකක්වත් නොවේ.

38. ගැටුම් ඇතිවීමේ දී හේතුවන සමාජමය මූල ගණයට අයත් වන්නේ
(1) බල ව්‍යාප්තිය
(2) සම්පත් ලබාගැනීම
(3) වර්ණභේද
(4) වෙළඳපොළ ලබාගැනීම

agaram.lk

39.කෘෂි නිෂ්පාදන,සේවා හා කාර්මික නිෂ්පාදන සඳහා නිදසුන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ
(1) වී, අධ්‍යාපන ,රෙදිපිළි
(2) වී, තැපැල් , අධ්‍යාපන
(3) පොල්තෙල් ,මෝටර්රථ , සෞඛ්‍ය
(4) මෝටර්රථ , බිත්තර , රෙදිපිළි

40. පහත සඳහන් ප්‍රකාශන සලකන්න.

- ආණ්ඩුකාර ධූරය අහෝසිකර ජනාධිපති ධූරයක් ඇති කිරීම.
- මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ප්‍රථම වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට  ඇතුළත් කිරීම.
- ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළමඋසාවිය ශ්‍රේෂ්ඨාධිකරණය ලෙස පිළිගැනීම.

ඉහත වෙනස්කම් සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වනුයේ

(1) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
(2) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(3) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව
(4) 1947සෝල්බරි ව්‍යවස්ථාව

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය- කොළඹ 07

## Grade 11–First TermTest – June – 2021

## පළමු වාර පරීක්ෂණ - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :02 hours

## Cvics

## පුරවැසි අධ්‍යාපනය

| 62 | S | II |
|---|---|---|

Name :- ..........................................Grade : -................ Index number:-....................

- ❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

01.

- i. අන්තර් **භාණ්ඩ** සඳහා **උදාහරණ 02ක් ලියන්න**
- ii. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අරමුණු 2ක් නම් කරන්න
- iii. **මූලික** ආර්ථික ප්‍රශ්න 2ක් ලියන්න.
- iv. ශ්‍රි ලංකාවේ මධ්‍යම ආණ්ඩුවේ බලය ප්‍රදේශීය ඒකක වලට විමධ්‍යගත කිරීමට බලපෑ හේතු 2ක් ලියන්න.
- v. දේශීය නීතියේ ප්‍රභේද 2ක් ලියන්න.
- vi. ගැටුම් නිරාකරණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රම 2ක් ලියන්න.
- vii. ප්‍රජතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක 2ක් ලියන්න.
- viii. අපේ රටේ ක්‍රියාත්මක වන පළාත්පාලන ආයතන 2ක් ලියන්න.
- ix. ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවල් 2ක් නම් කරන්න.
- **x.** තරඟකාරී පක්ෂ ක්‍රමයක දැකිය හැකි යහපත් ලක්ෂණ 2ක් ලියන්න. **(ලකුණු 2x10)**

02.

- i. නීතිය යනු කුමක්ද? (ලකුණු 2)
- ii. නීතියේ මූලාශ්‍ර 3ක් නම් කරන්න. (ලකුණු 3)
- iii. (අ) නීතිය ක්‍රියාවට නංවන ප්‍රධාන භූමිකා 3ක් නම් කරන්න. (ලකුණු 3)
  (ආ) එක් භූමිකාවකට අයත් බලතල හා කාර්යයන් 2ක් විස්තර කරන්න. (ලකුණු 2)

03.

- i. ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුවේ විවිධ ස්ථර 2ක් නම් කරන්න. (ලකුණු 2)
- ii. ආණ්ඩුවේ විවිධ ස්ථර කෙරෙහි පුරවැසියන්ගේ යුතුකම් හා වගකීම් 3ක් ලියන්න (ලකුණු 3)
- iii. (අ) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යුහයට අයත් කොටස් 3ක් නම් කරන්න. (ලකුණු 3)
  (ආ) ඉන් එක් කොටසකට අයත් බලතල හා කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 2)

04.

- i. වර්තමාන ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන වර්ග 2ක් නම් කරන්න. (ලකුණු 2)
- ii. මහනගර සභාවට පැවරී ඇති බලතල 3ක් ලියන්න. (ලකුණු 3)
- iii. (අ) පළාත් පාලන ආයතන වලට පැවරී ඇති ප්‍රාධාන තේමා 3 නම් කරන්න. (ලකුණු 3)
  (ආ) ඉන් එක් තේමාවක් යටතේ ඉටු කෙරෙන කාර්යයන් විස්තර කරන්න. (ලකුණු 2)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

05.

i. නීතියේ අධිපත්‍ය යනු කුමක්ද ? (ලකුණු 2)

ii. නීතියේ අධිපත්‍ය තහවුරු කිරීම සඳහා සමාජයක දක්නට ඇති ලක්ෂණ 3ක් ලියන්න (ලකුණු 3)

iii. (අ) අධිකරණයේ ස්වාධීන ආරක්ෂා කිරීම සඳහා අණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන 3ක් ලියන්න (ලකුණු 3)

(ආ) ඉන් එක් ප්‍රතිපාදනයක් පිළිබඳව අධිකරණයේ ස්වාධීනත්වයට බලපාන අයුරු පැහැදිලි කරන්න (ලකුණු 2)

06.

i. අර්ථ ක්‍රමයක් යනු කුමක්ද? (ලකුණු 2)

ii. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලියේ මූලික අවස්ථා 3 නම් කරන්න (ලකුණු 3)

iii. (අ) ශ්‍රීලංකාවේ වර්තමාන ආර්ථික සංවර්ධනයක් සමඟ ඇති වූ වාසි 3ක් ලියන්න (ලකුණු 3)

(ආ) ගෝලීයකරණය නිසා ශ්‍රීලංකාවට සිදුවූ සෘණාත්මක බලපෑමක් විස්තර කරන්න (ලකුණු 2)

07.

i. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද ? (ලකුණු 2)

ii. ප්‍රාජාතන්ත්‍රාවාදී පාලනයක දක්නට ඇති අංග ලක්ෂණ 3ක් නම් කරන්න (ලකුණු 3)

iii. (අ) නූතන රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ 3ක් නම් කරන්න (ලකුණු 3)

(ආ) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන්ගේ යුතුකම් පිළිබඳව පැහැදිලි කරන්න (ලකුණු 2)

Agaram.LK - Keep your dreams alive!

agaram.lk